ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

# 1997 අංක 5 දරන ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1997 ජූනි මස 05 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1997 ජූනි මස 06 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 6.75 යි. තැපැල් ගාස්තුව : රු. 4.50 යි.

# 1997 අංක 05 දරන ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතන (සංශෝධන) පනත

(සහතිකය සටහන් කළේ 1997 ජූනි මස 05 වැනි දින)

එල්. ඩී.–ඕ. 21/96.

## 1981 අංක 55 දරන ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :— ලුහුඬු නාමය.

1. මේ පනත 1997 අංක 05 දරණ ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1981 අංක 55 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1981 අංක 55 දරන ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතන පනතේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (අ) ඡේදය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

" (අ) ගණිතය, භෞතික හා රසායන විද්‍යාවන්, ජීව විද්‍යාවන්, සමාජ විද්‍යාවන් සහ දර්ශනය යන විෂයයන් පුළුල්ම අර්ථයෙන් ගෙන, එම විෂයයන් කෙරෙහි විශේෂ අවධානයක් ඇතිව, සාමාන්‍ය වශයෙන් මූලික අධ්‍යයන පිළිබඳව පර්යේෂණ සහ මුල් විමර්ශන ආරම්භ කිරීම, වැඩි දියුණු කිරීම සහ පැවැත්ම ද ;"

(2) එම වගන්තියේ (ආ) ඡේදයෙහි "ශාස්ත්‍රීය වැඩ කටයුතු" යන වචන වෙනුවට "පර්යේෂණ වැඩ කටයුතු" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) එම වගන්තියේ (ඇ) ඡේදයෙහි "ආයතනයේ කටයුතුවලට" යන වචන වෙනුවට "ආයතනයේ පර්යේෂණ කටයුතුවලට" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(4) එම වගන්තියේ (ඈ) ඡේදයේ "වෙනත් රටවල විද්‍යා කටයුතුවල" යන වචන ඉවත්කොට ඒ වෙනුවට "ජාතික යහපත ආරක්ෂා කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට වග බලා ගන්නා අතරම වෙනත් රටවල විද්‍යා කටයුතුවල" යන වචන ආදේශ කිරීමෙන්.

2—ඩී 042322 –6,550 (96/11)

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3**. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ (ආ) ඡේදයේ "මහාචාර්ය පදවි, සාමාජිකත්ව" යන වචන වෙනුවට "පර්යේෂණ මහාචාර්ය පදවි, ආශ්‍රිත පර්යේෂණ මහාචාර්ය පදවි" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4**. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ "ශාස්ත්‍රීය සභාව" යන වචන වෙනුවට "පර්යේෂණ සභාව" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5**. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (i) වන උපවගන්තියෙහි—

(අ) එම උපවගන්තියේ (v) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(vඅ) විද්‍යා කටයුතු පිළිබඳ ජනාධිපතිවරයාගේ උපදේශකවරයා ;" සහ

(ආ) එම වගන්තියේ (vi) ඡේදයේ "තුන්දෙනෙක් " යන වචන වෙනුවට "දෙදෙනෙක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියෙහි "ශාස්ත්‍රීය සභාව" යන යෙදුම යෙදී ඇති කවර හෝ අවස්ථාවක දී" පර්යේෂණ සභාව" යන යෙදුම ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6**. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(4) ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ විධානයට හා පාලනයට යටත්ව, ආයතනයේ සාමාන්‍ය පරිපාලනයට සහ ශාස්ත්‍රීය නොවන කාර්ය මණ්ඩලයේ විනය පාලනය සම්බන්ධයෙන් ලේකම්වරයා වගකිව යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (ඇ) ඡේදයේ (i) වන උපඡේදයේ "මහාචාර්ය ධුර, සාමාජිකත්ව" යන වචන වෙනුවට "පර්යේෂණ මහාචාර්ය ධුර, ආශ්‍රිත පර්යේෂණ මහාචාර්ය ධුර" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියෙහි "ශාස්ත්‍රීය සභාව" යන යෙදුම යෙදී ඇති කවර හෝ අවස්ථාවකම "පර්යේෂණ සභාව" යන යෙදුම ආදේශ කිරීමෙන් ; සහ

(3) එම වගන්තියෙහි "ශාස්ත්‍රීය කරුණක්" යන වචන යෙදී ඇති කවර හෝ අවස්ථාවකම "පර්යේෂණ වලට අදාළ වූ කරුණක්" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ආයතනයේ පර්යේෂණ සභාව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) ආයතනයේ අධ්‍යක්ෂවරයා (නිල බලයෙන්) සභාපතිවරයා විය යුතු ය ;

(ආ) විද්‍යා ක්ෂේත්‍රයෙහි ප්‍රසිද්ධියක් ලබා ඇති තැනැත්තන් අතුරින් ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන තැනැත්තන් දෙදෙනෙක්;

(ඇ) ආයතනයේ පර්යේෂණ මහාචාර්යවරුන්, ආශ්‍රිත පර්යේෂණ මහාචාර්යවරුන් සහ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ අධි සාමාජිකයන් ;

(ඇ) ආයතනයේ පර්යේෂණ අධි සාමාජිකයන් විසින් ඔවුන් අතුරින් තෝරා පත් කර ගනු ලබන සාමාජිකයන් තුන්දෙනෙක් ;

(ඉ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම් කරනු ලැබූ තැනැත්තන් අතුරින් මණ්ඩලය විසින් පත් කරනු ලබන්නා වූ ද, මණ්ඩලයේ මතය අනුව මූලික පර්යේෂණවල දී විශේෂ දක්ෂතා පෙන්නුම් කර ඇති වූ ද, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල වලින් තෝරා ගනු ලැබූ නියෝජිතයන් පස්දෙනෙක්."

(2) එහි (3) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(4) මියයෑමෙන්, හෝ තත් කාර්ය සඳහා ජනාධිපතිවරයා වෙත යවනු ලබන ලිපියක් මගින් ඉල්ලා අස්වීමෙන් කලින් ධුරය අත්හැරිය හොත් මිස, ආයතනයේ අධ්‍යක්ෂවරයා, පර්යේෂණ මහාචාර්යවරු, ආශ්‍රිත පර්යේෂණ මහාචාර්යවරු සහ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ අධි සාමාජිකයන් හැර, සභාවේ සෑම සාමාජිකයකුම තමන් තෝරා පත් කර ගැනීමේ හෝ පත්වීමේ දින සිට අවුරුදු තුනක කාලයක් ධුර දැරිය යුතුය".

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

**9**. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (ආ) ඡේදයෙහි "තිදෙනා" යන වචන වෙනුවට "දෙදෙනා" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (ඇ ඡේදයෙහි "මහාචාර්යවරයන්, බාහිර මහාචාර්යවරයන් සහ සාමාජිකයන්" යන වචන වෙනුවට "පර්යේෂණ මහාචාර්යවරයන්, බාහිර පර්යේෂණ මහාචාර්යවරයන් සහ ආශ්‍රිත පර්යේෂණ මහාචාර්යවරයන්" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) එම වගන්තියේ (ඉ) ඡේදයෙහි "ශාස්ත්‍රීය" යන වචනය වෙනුවට "පර්යේෂණ" යන වචනය ආදේශ කිරීමෙන් ;

(4) එම වගන්තියේ (ඊ) ඡේදයෙහි "අධ්‍යයන අංශය" යන වචන වෙනුවට "පර්යේෂණ ව්‍යාපෘති ඒකක" යන වචන ආදේශ කිරීමෙන්.

*ප්‍රධාන ප්‍රඥප්තියේ III වන කොටස ප්‍රතියෝජනය කිරීම.*

10. ප්‍රධාන ප්‍රඥප්තියේ III වන කොටසේ 12 සිට 18 දක්වා වූ වගන්ති (එම වගන්ති දෙක ද ඇතුළුව) මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරනු ලැබේ :—

## 'III වන කොටස

### ආයතනයේ ව්‍යාපෘති සහ පර්යේෂණ කාර්ය මණ්ඩලය.

*ආයතනයේ ව්‍යාපෘති.*

12. සභාවේ උපදෙස් අනුව මණ්ඩලය විසින් තීරණය කරනු ලබන (මෙහි මින් මතු "ව්‍යාපෘති"යනුවෙන් සඳහන් කරනු ලබන) පර්යේෂණ ව්‍යාපෘති ඒකක වලින් ආයතනය සංයුක්ත විය යුතු ය.

*ව්‍යාපෘතිවල පර්යේෂණ කාර්ය මණ්ඩලය.*

13. එක් එක් ව්‍යාපෘතියේ පර්යේෂණ කාර්ය මණ්ඩලය පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) පර්යේෂණ මහාචාර්යවරුන්:

(ආ) බාහිර පර්යේෂණ මහාචාර්යවරුන්:

(ඇ) ආශ්‍රිත පර්යේෂණ මහාචාර්යවරුන්:

(ඈ) බාහිර ආශ්‍රිත පර්යේෂණ මහාචාර්යවරුන්:

(ඉ) ජ්‍යෙෂ්ඨ පර්යේෂණ අධි සාමාජිකයන් : සහ

(ඊ) පර්යේෂණ අධි සාමාජිකයන්.

*අධ්‍යක්ෂවරයා පර්යේෂණ මහාචාර්යවරයා ලෙස කටයුතු කළ හැකි බව.*

14. තමාගේ වෙනත් කාර්යයන්ට අතිරේකව, අධ්‍යක්ෂවරයා පර්යේෂණ මහාචාර්යවරයකු ලෙස ද කටයුතු කළ හැකි ය.

ආයතනයේ පර්යේෂණ කාර්ය මණ්ඩලය.

15. ආයතනයේ පර්යේෂණ කාර්ය මණ්ඩලය, අධ්‍යක්ෂවරයා, සියලුම ව්‍යාපෘතිවල පර්යේෂණ මහාචාර්යවරයන්, ආශ්‍රිත පර්යේෂණ මහාචාර්යවරයන්, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ අධි සාමාජිකයන් සහ පර්යේෂණ අධි සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.'

ප්‍රධාන ප්‍රඥප්තියේ IV වන කොටසේ ශීර්ෂය සංශෝධනය කිරීම.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ IV වන කොටසේ ශීර්ෂයේ "ශාස්ත්‍රීය" යන වචනය වෙනුවට "පර්යේෂණ" යන වචනය ආදේශ කිරීමෙන් එම ශීර්ෂය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තියේ (1) වන උප වගන්තියේ "මණ්ඩලය විසින් පත් කරනු ලැබිය යුතු ය" යන වචන වෙනුවට, "මණ්ඩලය විසින් පත් කරනු ලැබිය යුතු ය. අධ්‍යක්ෂවරයා නැවත පත් කරනු ලැබුවහොත් මිස, ඔහුගේ ධුර කාලය ඔහු පත් කරනු ලැබූ දින සිට අවුරුදු තුනක් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියෙහි (2) වන උපවගන්තියෙහි "මහාචාර්යවරයා හෝ අදාළ අංශයේ ප්‍රධානියා" යන යෙදුම වෙනුවට "පර්යේෂණ මහාචාර්යවරයා හෝ ව්‍යාපෘතියේ ප්‍රධානියා" යන යෙදුම ආදේශ කිරීමෙන්; සහ

(2) එම වගන්තියෙහි "මහාචාර්යවරයන්" සහ "සාමාජිකයන්" යන වචන යෙදී ඇති කවර හෝ අවස්ථාවකම ඒ වෙනුවට පිළිවෙලින් "පර්යේෂණ මහාචාර්යවරයන්" සහ "ආශ්‍රිත පර්යේෂණ මහාචාර්යවරයන්" යන වචන ආදේශ කිරීමෙන්.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තියේ "ශාස්ත්‍රීය කාර්ය මණ්ඩලය" යන වචන යෙදී ඇති සෑම ස්ථානයකදීම ඒ වෙනුවට "පර්යේෂණ කාර්ය මණ්ඩලය" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තියේ (1) වන උප වගන්තියේ "මහාචාර්යවරයකුම, සාමාජිකයකුම" යන වචන වෙනුවට "පර්යේෂණ මහාචාර්යවරයකුම, ආශ්‍රිත පර්යේෂණ මහාචාර්යවරයකුම," යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තියේ (3) වන උප වගන්තියේ "මහාචාර්යවරයකු විසින් හෝ සාමාජිකයකු විසින්" යන වචන වෙනුවට "පර්යේෂණ මහාචාර්යවරයකු විසින් හෝ ආශ්‍රිත පර්යේෂණ මහාචාර්යවරයකු විසින්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය සංශෝධනය කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තියේ "මහාචාර්යවරයකු, සාමාජිකයකු" යන වචන වෙනුවට "පර්යේෂණ මහාචාර්යවරයකු, ආශ්‍රිත පර්යේෂණ මහාචාර්යවරයකු" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය සංශෝධනය කිරීම.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තියේ "ශාස්ත්‍රීය කාර්ය මණ්ඩලයේ" යන වචන වෙනුවට "පර්යේෂණ කාර්ය මණ්ඩලයේ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය සංශෝධනය කිරීම.

**19.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට, සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.